Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම - 2019

01. *යෝග්‍යතා :*

- පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් 2019.04.08 දින හෝ එදිනට පෙර ලැබෙන සේ අයදුම්පත් යොමු කළ යුතුය.

1.1 *සුදුසුකම්.-*

I. ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුය.

II. ගුරු පත්වීම්වලට අදාළව පිළිගත් සුවිශේෂී කරන ලද පහත VII පරිදි සඳහන් විෂය ක්ෂේත්‍රවලට අයත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.

III. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ක බස්නාහිර පළාතේ ස්ථිර අඛණ්ඩ පදිංචිය තිබිය යුතුය.

IV. සෑම අපේක්ෂකයකුම ගුරුවරයෙක් වශයෙන් රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් මානසික සහ ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

V. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 40 ට නොවැඩි විය යුතුය.

(බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරු දරන සුදුසුකම් සහිත උපාධිධාරීන්ට මෙම වයස් සීමාව බල නොපැවැත්වේ)

VI. *අධ්‍යාපන සුදුසුකම්.-*

- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට බස්නාහිර පළාත් ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව පහත දැක්වෙන සුදුසුකම් සපුරා තිබිය යුතුය.

| *ගුරු වර්ගය* | *විෂය අංකය* | *උපාධිය* | *උපාධිය හැදෑරූ මාධ්‍යය* |
|---|---|---|---|
| ප්‍රාථමික | 01 | ශාස්ත්‍රවේදී උපාධිය | සිංහල<br>ඉංග්‍රීසි<br>දෙමළ |
| කලා | 02 | ශාස්ත්‍රවේදී උපාධිය | සිංහල<br>ඉංග්‍රීසි<br>දෙමළ |
| ගණිතය | 03 | ශුද්ධ ගණිතය/ ව්‍යවහාරික ගණිතය/ සංයුක්ත ගණිතය/ ප්‍රධාන විෂයයක් වශයෙන් ඇතුළත් විද්‍යාවේදී උපාධිය | සිංහල<br>ඉංග්‍රීසි<br>දෙමළ |
| තොරතුරු තාක්ෂණය | 04 | තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධිය (IT) හෝ පරිගණක විද්‍යාව පිළිබඳ උපාධිය (BSC Computer Science) | සිංහල<br>ඉංග්‍රීසි<br>දෙමළ |
| ඉංග්‍රීසි | 05 | ඉංග්‍රීසි ප්‍රධාන විෂයයක් වශයෙන් හදාරා ඇති උපාධියක් තිබිය යුතුය. | ඉංග්‍රීසි |
| වානිජ | 06 | වානිජවේදී උපාධියක්/ වාණිජ විෂයය ධාරාවට අයත් විද්‍යාවේදී උපාධිය | සිංහල<br>දෙමළ<br>ඉංග්‍රීසි |

| ගුරු වර්ගය | විෂය අංකය | උපාධිය | උපාධිය හැදෑරූ මාධ්‍යය |
|---|---|---|---|
| විද්‍යාව | 07 | ජීව විද්‍යාව/ රසායන විද්‍යාව/ භෞතික විද්‍යාව ප්‍රධාන විෂයයක් වශයෙන් ඇතුළත් විද්‍යාවේදී උපාධිය | සිංහල<br>දෙමළ<br>ඉංග්‍රීසි |
| චිත්‍ර | 08 | ප්‍රධාන විෂයයක් වශයෙන් චිත්‍ර ඇතුළත් වන ලලිතකලාවේදී සෞන්දර්යය උපාධිය හෝ ශාස්ත්‍රවේ දී විශේෂ (චිත්‍ර) උපාධිය | සිංහල<br>දෙමළ<br>ඉංග්‍රීසි |
| පෙරදිග සංගීතය | 09 | ප්‍රධාන විෂයයක් වශයෙන් පෙරදිග සංගීතය ඇතුළත් වන ලලිතකලාවේදී උපාධිය / සෞන්දර්යය උපාධිය හෝ ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය (පෙරදිග සංගීතය) | සිංහල<br>දෙමළ<br>ඉංග්‍රීසි |
| නැටුම් | 10 | ප්‍රධාන විෂයයක් වශයෙන් නැටුම් ඇතුළත්වන ලලිතකලාවේදී උපාධිය/ සෞන්දර්යය උපාධිය හෝ ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය (නර්තනය) | සිංහල<br>දෙමළ<br>ඉංග්‍රීසි |
| බටහිර සංගීතය | 11 | ප්‍රධාන විෂයයක් වශයෙන් බටහිර සංගීතය ඇතුළත්වන ලලිතකලාවේදී උපාධිය /සෞන්දර්යය උපාධිය හෝ ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය (බටහිර සංගීතය) | සිංහල<br>දෙමළ<br>ඉංග්‍රීසි |
| දෙවන භාෂාව (දෙමළ) | 12 | උපාධියට දෙමළ භාෂාව ප්‍රධාන විෂයයක් වශයෙන් සමත්ව තිබීම,<br>*සහ*<br>අ.පො.ස (සා.පෙළ) විභාගයේදී සිංහල භාෂාවට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම හෝ පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ හෝ ව්‍යවස්ථාපිත ආයතනයක මාස 06 කට නොඅඩු සිංහල භාෂාව පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ පිළිගත් පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම | සිංහල<br>දෙමළ<br>ඉංග්‍රීසි |
| නාට්‍ය හා රංග කලාව | 13 | නාට්‍ය හා රංග කලාව පිළිබඳ විශේෂ උපාධියක් හෝ නාට්‍ය හා රංග කලාව ප්‍රධාන විෂයයක් සහිතව ශාස්ත්‍රවේදී උපාධිය | සිංහල<br>දෙමළ<br>ඉංග්‍රීසි |
| කෘෂිකර්මය | 14 | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී උපාධිය හෝ කෘෂි විද්‍යාවේදී උපාධිය | සිංහල<br>දෙමළ<br>ඉංග්‍රීසි |
| ශාරීරික අධ්‍යාපනය | 15 | ශාරීරික අධ්‍යාපන විද්‍යාවේදී උපාධිය/ ශාරීරික අධ්‍යාපන විෂයයට අදාළ උපාධියක් | සිංහල<br>දෙමළ<br>ඉංග්‍රීසි |
| විශේෂ අධ්‍යාපනය | 16 | විශේෂ අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය | සිංහල<br>දෙමළ<br>ඉංග්‍රීසි |
| ගෘහ ආර්ථික විද්‍යාව | 17 | ආහාර විද්‍යාව හා තාක්ෂණ විද්‍යාව උපාධිය/ ආහාර විද්‍යාව හා පෝෂණ විද්‍යාවේදී උපාධිය | සිංහල<br>දෙමළ<br>ඉංග්‍රීසි |

*සහ*

- අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දෙවරකට නොවැඩි වාර ගණනක දී මව්බස හා ගණිතය සඳහා සාමාර්ථයන් සහිතව සම්මාන තුනක් සමග විෂයයන් 6ක් සමත් වීම. (එක් වතාවකදී අවම වශයෙන් විෂයයන් 05 ක් සමත්වී තිබිය යුතුය.)

- අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී එක් වරකදී විෂයන් තුනක් සමත් වීම.

02. *බඳවා ගැනීමේ ක්‍රමය :*

2:1 පළාත් සහා පාසල්වල පවතින ගුරු පුරප්පාඩු වෙනුවෙන් 2019.04.08 දිනට නියමිත සුදුසුකම් සපුරා ඇති උපාධිධාරීන්ට අයදුම් කළ හැකිය.

2:2 2011.01.01 දින සිට ක්‍රියාත්මක නව බස්නාහිර පළාත් ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2.4 වගන්තිය අනුව බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

2:3 තරග විභාගයක් හා ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වා ලකුණු ප්‍රමුඛතාව අනුව පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. (විභාග ප්‍රතිඵල මත බඳවා ගැනීමේ කාලසීමාව 2020.12.31 දිනට නියමිත පුරප්පාඩු සඳහා පමණක් අදාළ වේ.)

2:4 තරග විභාගය සමත්වීම සඳහා සෑම විෂයයකටම 40% ඉක්මවා ලකුණු ලබා ගත යුතු අතර තරග විභාගය සමත්වන අයදුම්කරුවන් පමණක් බස්නාහිර පළාත් ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2.4.2 හි දැක්වෙන ප්‍රායෝගික පරීක්ෂණය සඳහා යොමු කරනු ලැබේ.

03 *අයදුම් කිරීමේ ක්‍රමය :*

3:1 A4 ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම භාවිතා කරමින් මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව අයදුම්පත් සකස්කර ගත යුතුය. 1-6 දක්වා කඩදාසියේ එක පැත්තක ද 7-13 දක්වා අනෙක් පසඳ සිටින සේ පිළියෙළ කර ගත යුතුය.

3:2 අදාළ ආදර්ශ ආකෘතියට නොගැලපෙන හා අසම්පූර්ණ අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිවැරදි නොවන තොරතුරු සපයා ඇති අවස්ථාවක දී බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ගනු ලබන ඕනෑම තීරණයකට ඔබ යටත් විය යුතුය.

3:3 නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2019.04.08 දින හෝ එදිනට පෙර **"ලේකම්, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, 109, මහා වීදිය, බත්තරමුල්ල"** යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"බස්නාහිර පළාත් සභා පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම - 2019"** යන්න සහ **ඉල්ලුම් කරන විෂය/ගුරු වර්ගය** සඳහන් කළ යුතුය.

3:4 විභාග ගාස්තු ලෙස රු. 600/- ක මුදලක් බස්නාහිර පළාතේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් බස්නාහිර පළාත් ආදායම් ශීර්ෂ අංක 20-03-02-99ට බැර වන ලෙස මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පත්‍රයේ පසු පිට නොගැලවෙන සේ අලවා එවිය යුතු වේ. ගෙවනු ලබන විභාග ගාස්තුව කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ.

3:5 තැපෑලේදී නැතිවන හෝ ප්‍රමාදවන අයදුම්පත් සම්බන්ධයෙන් කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබෙන අතර, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු අයුරකින් සලකා බලනු නොලැබේ.

3:6 ***සැලකිය යුතුයි :-*** අයදුම්පත්‍රය සමග විස්තර සහිත උපාධි සහතිකයේ ඡායා පිටපතක් අනිවාර්යෙන්ම අමුණා එවිය යුතුය. එසේ නොවන්නේ නම් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3:7 *අත්සන සහතික කිරීම.-*

අයදුම්පතේ හා විභාග ප්‍රවේශ පත්‍රයේ අත්සන් සහතික කිරීමට බලයලත් අයකු විසින්, අයදුම්කරුගේ අත්සන සහතික කළ යුතුය. අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතීඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලය ලත් නිලධාරීවරයෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු, රු.498,960/-ක් හෝ ඊට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ මාණ්ඩලික ශ්‍රේණියේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු , බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන පූජක කෙනෙකු හෝ යන මොවුන්ගෙන් කවරෙකු හෝ ලවා සහතික කරනු ලැබ තිබිය යුතුය.

3:8 දැනටමත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ගේ අත්සන අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු මගින් සහතික කරනු ලැබ තිබිය යුතු අතර අයදුම්පත ආයතන ප්‍රධානියා මගින් යොමු කළ යුතුය.

04. *සේවා කොන්දේසි.-*

4:1 මෙම පත්වීම ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතු වේ.

4:2 මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රා.ප.ච. 03/2016 අනුව (ජීඊ-1-2016) රු. 27,740 - 6 x 300-7 x 380 - 2 x 445-33,090/ - වේ. 14 වන වැටුප් පියවර (රු. 32,200/-) ආරම්භක වැටුප් පියවර වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන II හි සඳහන් පරිදි ගෙවීම් සිදු කරනු ලැබේ.

4:3 උසස්වීම් බස්නාහිර පළාත් ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන යටතේ සිදු කරනු ඇත .

4:4 උපාධියට අදාළ විෂයයන් යටතේ අයදුම් කළ යුතු අතර, පත්වීම් විෂයය කිසිදු හේතුවක් නිසා හෝ වෙනස් කරනු නොලැබේ.

05. *අයදුම්පත් සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්.-*

5:1 අයදුම්පත පිරවීමේ දී පහත උපලේඛන 01, 02, 03 හි සඳහන් කේත අංක ඒ අයුරින්ම භාවිතා කළ යුතුය.

**උපලේඛනය 01**

| *භාෂා මාධ්‍යය* | *කේත අක්ෂරය* |
|---|---|
| සිංහල මාධ්‍යය | S |
| දෙමළ මාධ්‍යය | T |
| ඉංග්‍රීසි මාධ්‍යය | E |

**උපලේඛනය 02**

| *විෂයය /ගුරු වර්ගය* | *කේත අංකය* |
|---|---|
| ප්‍රාථමික | 01 |
| කලා | 02 |
| ගණිතය | 03 |
| තොරතුරු තාක්ෂණය | 04 |
| ඉංග්‍රීසි | 05 |
| වානිජ | 06 |
| විද්‍යාව | 07 |
| චිත්‍ර | 08 |
| පෙරදිග සංගීතය | 09 |
| නැටුම් | 10 |
| බටහිර සංගීතය | 11 |
| දෙවන භාෂාව (දෙමළ) | 12 |
| නාට්‍ය හා රංග කලාව | 13 |
| කෘෂිකර්මය | 14 |
| ශාරීරික අධ්‍යාපනය | 15 |
| විශේෂ අධ්‍යාපනය | 16 |
| ගෘහ ආර්ථික විද්‍යාව | 17 |

උපලේඛනය 03

| *දිස්ත්‍රික්කය* | *කේත අක්ෂරය* |
|---|---|
| කොළඹ | C |
| ගම්පහ | G |
| කළුතර | K |

06. මෙම නිවේදනයේ ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳ තීරණය කිරීමේ අයිතියද බඳවා ගැනීමේ ක්‍රමයට අදාළ කොන්දේසි සංශෝධන ද, කිසියම් පුරප්පාඩුවලින් කොටසක් හෝ මුළුමනින්ම පිරවීම හෝ නොපිරවීම පිළිබඳ අවසන් තීරණය ගැනීම බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ.

07. අයදුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ.අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය www.psc.wp.gov.lk මගින් පළකරනු ඇත. එම නිවේදනය පළ වී දින 07 ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක්ද, අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, අතැතිව ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරදිව සඳහන් කරමින් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයෙන් විමසිය යුතුය.

08. විභාගය සඳහා ඉල්ලුම් කරනු ලබන සියලුම අයදුම්කරුවන්ට සුදුසුකම් සම්පූර්ණකර ඇතැයි උපකල්පනය කර විභාගයට පෙනී සිටීමට අවස්ථාව ලබා දෙනු ලැබේ. විභාගයට පෙනී සිටීමේ අවස්ථාව ලැබීම සුදුසුකම් සම්පූර්ණ කර ඇති බවට පිළිගැනීමක් වශයෙන් නොසැලකිය යුතුය. එසේ වුවද අයදුම්කරු සුදුසුකම් සම්පූර්ණ කර නොමැති බව අනාවරණය වන ඕනෑම අවස්ථාවක විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට හා පත්වීම් ලබා දීම ප්‍රතික්ෂේප කිරීමේ බලය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

09. මෙම *ගැසට්* නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්වේ.

එම්. ජී. ඒ. තිලකරත්න
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත

ආදර්ශ අයදුම්පත්‍රය

කාර්යාල ප්‍රයෝජනය සඳහා :

***බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම - 2019***

| | |
|---|---|
| ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | |
| අයදුම් කරන විෂයය අංකය | |

01. පත්වීම් සඳහා අයදුම් කරනු ලබන භාෂා මාධ්‍යයේ අක්ෂරය :

(අදාළ අංකය *ගැසට්* නිවේදනයේ උපලේඛන 01 අනුව කොටුව තුළ යොදන්න.)
(පත්වීම් සඳහා අයදුම් කරනු ලබන භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට සිදුවේ.)

02. *ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :*

| *දිස්ත්‍රික්කය* | *දිස්ත්‍රික්ක සංකේතය* |
|---|---|
| | |

(*ගැසට්* නිවේදනයේ උපලේඛන 03 අනුව යොදන්න.)

03. 3.1 සම්පූර්ණ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
(*උදා.*- MR/MRS/MISS SMARAKOON MUDEYANSELAGE NIMAL HERATH)
..........
..........

3.2 අගට යොදන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම :
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) (*උදා.*- HERATH S.M.N.)
..........
..........

3.3 සම්පූර්ණ නම : (සිංහල අකුරින් / දෙමළ අකුරින්)
(*උදා.* - සමරකෝන් මුදියන්සේලාගේ නිමල් හේරත්)
..........
..........

3.4 අගට යොදන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම :
(සිංහල අකුරින්) (උදා.- හේරත් එස්. එම්. එන්.)
..........
..........

04. 4.1 ස්ථිර ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
..........
..........

4.2 ස්ථිර ලිපිනය : (සිංහලෙන්/දෙමළෙන්)
..........
..........
(ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)

05. 5.1 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

5.2 උපන් දිනය : වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |

5.3 අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස - අවුරුදු : | | | මාස : | | | දින : | | |

5.4 ස්ත්‍රී/පුරුෂ භාවය : | | ස්ත්‍රී - 1, පුරුෂ - 2 (අදාල අංකය කොටුව තුළ යොදන්න.)

5.5 විවාහක/අවිවාහක බව - විවාහක : | | අවිවාහක : | |

5.6 දුරකථන අංකය :

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජංගම දුරකතනය | | | | | | | | | | |
| ස්ථාවර දුරකතනය | | | | | | | | | | |

06. *අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තරය :*

6.1 ලබාගෙන ඇති උපාධිය :..........

I. නිකුත් කළ විශ්වවිද්‍යාලය :..........
II. උපාධිය වලංගු දිනය :..........
III. ලබා ඇති පන්ති සාමාර්ථය :..........
IV. උපාධිය හදාරා ඇති ප්‍රධාන විෂයය/විෂයයන් :..........

6.2. *අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) ප්‍රතිඵල :*

*පළමුවන වර :* *දෙවනවර :*

වර්ෂය :.................. විභාග අංකය :........................ වර්ෂය :...................... විභාග අංකය :...................

| *විෂයයන්* | *ලබා ඇති ශ්‍රේණිය* | *විෂයයන්* | *ලබා ඇති ශ්‍රේණිය* | *විෂයයන්* | *ලබා ඇති ශ්‍රේණිය* | *විෂයයන්* | *ලබා ඇති ශ්‍රේණිය* |
|---|---|---|---|---|---|---|---|
| 1. | | 6. | | 1. | | 6. | |
| 2. | | 7. | | 2. | | 7. | |
| 3. | | 8. | | 3. | | 8. | |
| 4. | | 9. | | 4. | | 9. | |
| 5. | | 10. | | 5. | | 10. | |

6.3. *අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) ප්‍රතිඵල :*

| *වර්ෂය :* | *විභාග අංකය :* |
|---|---|
| *විෂයයන්* | *ලබා ඇති ශ්‍රේණිය* |
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

07. 7.1 ගෙවා ඇති විභාග ගාස්තු රුපියල් (අකුරින්) :..............................................................................................

7.2 කුවිතාන්සියේ අංකය :..............................................................................................

7.3 නිකුත්කළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :..............................................................................................

7.4 දිනය :..............................................................................................

| |
|---|
| කුවිතාන්සියේ ඡායා පිටපතක් ඔබ වෙත තබාගන්න.<br>මුදල් කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න. |

08. ඔබ ආබාධිත තත්ත්වය යටතේ අයදුම් කරන්නේ නම්, ඒ පිළිබඳ විස්තර ඇතුළත් කරන්න.

..............................................................................................

..............................................................................................

09. ඔබ සාපරාධී වරදක් සම්බන්ධයෙන් අධිකරණයෙන් වරදකරුවකු කර ඇති අයෙක්ද ? (ඔව්/නැත)

10. එසේම ඔබ කිසියම් වරදක් සම්බන්ධව රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූ පුද්ගලයෙක් ද? (ඔව්/නැත)

11. උක්ත 09 ට හෝ 10 ට පිළිතුරු "ඔව්" නම් විස්තර සපයන්න :..............................................................................................

12. *අයදුම්කරුගේ/අයදුම්කාරියගේ ප්‍රකාශය :*

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බව ප්‍රකාශ කරමි. *ගැසට්* නිවේදනයේ සඳහන් සියලුම කොන්දේසි හා නියමයන් කියවා තේරුම්ගත් අතර එම කොන්දේසි හා නියමයන්ට එකඟව මෙම අයදුම්පත ඉදිරිපත් කරන බව ද ප්‍රකාශ කරමි. එසේම බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නම් කරන ඕනෑම පාසලක සේවය කිරීමට කැමැත්තෙමි. මා මෙම තනතුරට තෝරාගනු ලැබීමෙන් පසුව ගුරු පත්වීමක් ලබාගැනීමට නුසුදුසු බව අනාවරණ වුවහොත් පත්වීම ශූන්‍ය හා බල රහිත සේ සලකා අවලංගු කිරීමට යටත්වන බව මම දනිමි. තව ද, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත්කිරීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව පනවනු ලබන නීතිරීතිවලට යටත් බව ද, මෙහි සඳහන් කිසිම තොරතුරක් පසුව වෙනස් නොකරන බව ද ප්‍රකාශ කරමි.

........................................ ..............................................

දිනය අයදුම්කරුගේ අත්සන.

13. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................................................................................ මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ..................................... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

........................................ ..............................................

දිනය සහතික කරන අයගේ අත්සන සහ නිල මුද්‍රාව.

සහතික කරන අයගේ නම :........................................................................................................................

තනතුර : ........................................................................................................................................

ලිපිනය : ......................................................................................................................................

- *ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

............................................................... මහතා/ මිය/ මෙනවිය ගේ ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ ඇය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ ස්ථිර සේවකයෙකු /සේවිකාවක වශයෙන් සේවය කරන බවත්, මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ ඇය සේවයෙන් නිදහස් කළ හැකි/ නොහැකි බවත් දන්වමි.

.....................................................................................

(ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.)

දිනය :........................................

තනතුර :...................................................................................................

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :.....................................................